## මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.05.13දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.05.13 වන දින පෙ.ව. 09.30ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමිය (ලං.ක.කො)**

අද දින සභා රැස්වීමට පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ කරන අතර පසු පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

රටතුල පැවති අසාමාන්‍ය තත්වය අවසන් වීමත් සමඟ දැනට රටේ වගකීම භාරගෙන සිටින ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මුලින්ම සුභ පතමි. රටතුල පැවති අසාමාන්‍ය තත්වය සැලකිල්ලට ගනිමින් පසුගිය සභා වාරයේදී සැණකෙළි නොපැවැත්විය යුතු යැයි තීරණයක් ලබා ගන්නා ලදී. එම තීරණය නොතකා සැණකෙළිය පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම පිළිගත නොහැකියි. සභාව විසින් ලබාගන්නා ලද තීරණය නොතකා සැණකෙළිය සඳහා අනුමැතිය ලබාදීම මෙම සභාව අපහාසයට පත්කිරීමක් බව සැලකිය යුතුයි. සභාව විසින් ලබාගන්නා ලද තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු වූ කරුණු මොනවාදැයි ප්‍රකාශ කරන ලෙසට ගරු සභාපතිතුමියගෙන් ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**

අපි සැණකෙළි සඳහා අනුමැතිය ලබානොදිය යුතු යැයි එදින තීරණයක් ලබාගෙන තිබුණා. නමුත් සැණකෙළිය සඳහා අවශ්‍ය සියලුම උපකරණ ඔවුන් ගෙනවිත් තිබුණා. මෙම උපකරණ ගෙන ඒම සඳහා විශාල මුදලක් වැයකළ බව පැවසුවා. පසුව මම අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් සමඟ දුරකථනයෙන් සම්බන්ධ වෙමින් මේ පිළිබඳව සාකච්ඡා කළා. ගරු මන්ත්‍රීවරුන් සමඟ සිදුකරන ලද සාකච්ඡාව අනුව ගරු මන්ත්‍රීවරුන්ගෙන් අත්සන් ලබාගෙන තමයි මේ සඳහා වූ අනුමැතිය ලබා දුන්නේ. ඔවුන් රැගෙනවිත් තිබුණු උපකරණ නැවත රැගෙන යාමට නොහැකි නිසා අපි අනුමැතිය ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

මීට පෙර මේ පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී, මෙවැනි හදිසි කටයුත්තකදී විශේෂ සභාවක් කැඳවමින් එම සභාව මඟින් තීරණයක් ලබාගන්නා ලෙසට මම පැවසුවා. ඔවුන්ගේ පහසුව තකා එම අනුමැතිය ලබාදී තිබුණත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු පිළිබඳව උනන්දුව දක්වා අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් සිටින බව සැලකිල්ලට නොගැනීම පිළිබඳව මා කණගාටුව ප්‍රකාශ කර සිටිමි. මා සමඟ දුරකථනයෙන් කතා කරන අවස්ථාවේදී වුවද සභාවේ තීරණය අනුව කටයුතු කරන ලෙසටයි මම ඉල්ලා සිටියේ. සභාව කියන්නේ ගරු මන්ත්‍රීවරුන් හතර පස් දෙනෙකු සම්බන්ධ කරගනිමින් කටයුතු කරන සභාවක් නෙවෙයි. ගරු මන්ත්‍රීවරුන් 16 දෙනෙක් සිටිනවා. එක් දිනයක අවකාශයක් ලබාදෙමින් පසු දින විශේෂ සභාව රැස්කර තීරණයක් ලබා ගන්න තිබුණා. මෙම කටයුත්ත පිළිබඳව චෝදනා ගොඩක් ආවා. එම සැණකෙළියේ අයිතිකරු වුවද අවසානයේදී අලාභයක් මත තමයි ගිහින් තියෙන්නේ. කිහිපදෙනෙකු තෘප්තිමත් කිරීම සඳහා සිදුකරන කටයුතු නිසා මුළු සභාවම අපහාසයට ලක්වෙනවා. පසුගිය සභා වාරයේදී 75% ක් මෙම කරුණු සම්බන්ධයෙන් පමණයි කතා කළේ. සභාව අවසන් වී එළියට යන අවස්ථාවේ මෙවැනි තත්වයක් පවතින බවට දුරකථන ඇමතුම් පැමිණෙනවා. එම අවස්ථාවේ සමහර අයගේ මලු පුරවා ගැනීම සඳහාත්, සමහරුන් තෘප්තිමත් කිරීම සඳහාත් මෙම කාර්යය සිදුවෙලා තිබෙනවා. කොපමණ සාකච්ඡා කළත් සභාවෙන් එළියට ගිය පසු මෙම කරුණු ක්‍රියාත්මක වෙන්නේ නැහැ. රටේ දැනට පවතින තත්වයත් මෙවැනි දේවල් නිසා තමයි සිදුව ඇත්තේ. සභාවට විරුද්ධව

මහජනතාව එන්නේ නැහැ කියලා කොහොමද විශ්වාස කරන්නේ. එවැනි දේවල් සිදු නොවිය යුතු නිසා තමයි මම කියන්නේ මින් ඉදිරියට සභාවෙන් ගන්නා ලද තීරණ කිසිම හේතුවක් මත වෙනස් කර කටයුතු කරන්න එපා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

පසුගිය මාසයේ සභා වාර්තාවේ තීරණ අංක 05 අනුව සැණකෙළි උත්සව සිදුකිරීමට අනුමැතිය ලබානොදී සිටිය යුතු බවට තීරණය කර තිබෙනවා. සභාව තුල එවැනි තීරණයක් ලබාගෙන ඉන් පසුව ඒ අය උපකරණ සියල්ල ගෙනවිත් කියන හේතුව මත හෝ කදුළු සැලුවායි කියන හේතුව මත හෝ කුමන පදනමක් මතද මෙම සැණකෙළිය පැවැත්වීමට අනුමැතිය ලබා දුන්නේ? යන ප්‍රශ්නයට ඉතා පැහැදිලි පිළිතුරක් ලබාදිය යුතුයි. මෙම සභා වාර්තාව මගින් පළාත් පාලන ආයතනය කුමන ස්ථානයේ කුමන ස්ථාවරයක සිටින්නේද යන්න අදහස් දැක්වීම පිළිබඳව ලේකම්තුමා පිළිතුරු ලබාදිය යුතුයි. මටත් ගරු මන්ත්‍රීවරයෙකු මගින් දුරකථන ඇමතුමක් ලැබුණා. අදහස් කිහිපයකුත් හුවමාරු කළා. සැණකෙළි උත්සවය සිදුකරනවා නම් ගරු මන්ත්‍රීවරුන්ගේ තත්වයට කුමක්ද සිදු වෙන්නේ? කියා මම ඇසුවා. කුමක් හෝ කරමු කියා කීවා. එහි ගැටළුවක් නැහැ. සභාවට කියා නීති රීති, සාරධර්ම තිබෙනවා. අත්සන් කළා කියන පමණින් සභාවේ තීරණය පසෙකළා කටයුතු කිරීම, පළාත් පාලන නීති රීති උල්ලංඝනය කිරීමක් බවටයි මම දකින්නේ. එදින අත්සන් කළ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි. මේ සියල්ලටම ගරු සභාපතිතුමිය පිළිතුරු ලබාදිය යුතුයි. ගරු මන්ත්‍රී ආනන්දන් මැතිතුමා පවසන පරිදි සභාවේ සාකච්ඡා කරන කරුණු පසෙකලා කටයුතු සිදුවෙනවා. එනිසා අප සභාවේ පරිපාලන කටයුතු භාරව සිටින ලේකම්තුමාද මෙයට පිළිතුරු ලබාදිය යුතුයි. සභාවේදී ලබාගන්නා තීරණ පමණයි මා ක්‍රියාත්මක කරන්නේ කියා, බොහෝ අවස්ථාවලදී ලේකම්තුමා පවසා තිබෙනවා. ඉතා සුළු කාරණා වලදී වුවත් සභාවේ අනුමැතිය ලබා දුන්නොත් පමණයි ක්‍රියාත්මක කරන්න පුළුවන් කියා ලේකම්තුමා තදින්ම පවසා තිබෙනවා.

මෙම කාරණාව ක්‍රියාත්මක කිරීමේදී යම් කිසි ගැටළුවක් මතුවී තිබුණොත් එම අවස්ථාවේදී කුමක්ද කරන්නේ? මෙම කාරණාව පිළිබඳව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වැඩි අවධානයක් යොමුකළ යුතුයි. අත්සන් කළ අයගේ නාම ලේඛනය, පිළිබඳව පළාත් පාලන කොමසාරිස් සහ සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ ස්ථාවරය කුමක්ද?, මෙවැනි දේවල් ඉටු කිරීමට නීතිමය ප්‍රතිපාදන තිබෙනවාද?, යන්න පැහැදිලි කළ යුතුයි. පසුගිය සභාවේදී භාෂා ගැටළුව පිළිබඳව අපි කතා කළා. ඒ අනුව තීරණයක් ද ලබාගෙන තිබුණා. නමුත් මෙවර සභා වාර්ථාව ලබාදුන් ලියුම් කවරය මුළුමනින්ම සඳහන් කර තිබුණේ සහෝදර භාෂාවෙන්. එය දුටුවිට මගෙන් සහ ගරු මන්ත්‍රීතුමාගෙන් ඔබතුමන්ලාගේ සභාවේ සභාපති සිංහලද, ලේකම් සහෝදර භාෂාවේද කියා ප්‍රශ්න කළා. මේ පිළිබඳව පසුගිය සභා රැස්වීමේදී සාකච්ඡා කළ බවට ප්‍රකාශ කරමින් අපි සභා වාර්තාව පෙන්වා සිටියා. එයට මෙලෙස පිළිතුරු ලබාදී තිබෙනවා. නමුත් මින් පසුව භාෂා දෙකෙන්ම ලබාදෙනවා කියා පවසමින් මෙලෙස සිදුකර ඇති බව මා පැවසුවා. 2022.04.11 දිනැති සභා වාර්තාව අනුමත කළ යුතු නම් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ ස්ථාවරය පැහැදිලි කළ යුතුයි. දුරකථනයෙන් හෝ සම්බන්ධ කරගන්න. පසුගිය කාලයේ සභාව විසින් ලබා ගන්නා තීරණ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒවා නිත්‍යානුකූල නොවන බවත් පවසා තිබෙනවා. නමුත් මෙම කාරණාව පිළිබඳව කුමන ස්ථාවරයක සිටිනවාද කියන එක දැනගත යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

පරීක්ෂණ නිලධාරී මහතාට මෙම කාරණාව පිළිබඳව දැනුම් දී තිබෙනවා. ඔහු ඒ පිළිබඳව ලිඛිත පිළිතුරක් ලබාදෙයි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

අපිට මේ පිළිබඳව එකක් ලිඛිතව පෙන්වන්න ඕනෑ. නැතිනම් සියළුම කරුණු විස්තරාත්මකව ඇතුලත් කර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමුකල ලිපිය හෝ අවශ්‍යයි. එසේ නොමැතිව ලබාගත් තීරණය සැහැල්ලුවට ලක්කර කටයුතු කිරීම පිළිගන්න බැහැ. මේ සඳහා නිසි පිළිතුරක් අවශ්‍යයි. එසේ නොමැතිව මෙම වාර්තාව යෝජනා ස්ථිර කිරීමෙන් කිසි තේරුමක් නැහැ.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**

සැණකෙළිය සඳහා අනුමැතිය ලබාදීම සම්බන්ධව පසුගිය සභා රැස්වීමේදී සාකච්ඡාවට ලක්වුණා. සභා වාරය අවසන් වූ වේලාවේ සැණකෙළියට සම්බන්ධ සියළුදෙනා පොලිස් ස්ථානය ඉදිරිපිට සිටියා. මම සහ ගරු මන්ත්‍රී දිසානායක මැතිතුමාත් එතැන සිටියා. මම බැහැම කියා කීවා. එහි සිටි පුද්ගලයෙකු ''මට රුපියල් ලක්ෂ 07 ක අලාභයක් සිදු වෙනවා, මම වහ බොන්නයි යන්නේ'' කියලා පැවසුවා. ''රත්තරන් භාණ්ඩ ටික උකස් කරලයි වියදම් ටික බලාගත්තේ'' කියා පැසුවා. මමත් ටික වෙලාවක් තර්ක කිරීමෙන් අනතුරුව යන්න ගියා. නමුත් එදින සවස මේ පිළිබඳව සාකච්ඡා කර අනුමැතිය ලබාදීමට තීරණය කර තිබුණා. මා සමඟ දුරකථනයෙන් සම්බන්ධ වී විමසා සිටියා. මම බැහැ කීවා. සියළු දේවල් මෙහෙමයි සිදුවූයේ. කුකුල් මස් කඩ, මස් කඩ ටෙන්ඩර් වලටත් මෙවැනි දේවල් තමයි සිදුවූයේ. මේක විගඩම් සභාවක් ලෙසටයි පවත්වාගෙන යන්නේ. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අපි නීති රීති පනවනවා. සමහරු එහි ගොස් යමක් ලබාගෙන, මේවා කතාකර කාලය නාස්ති කරන එක නවත්වා මෙම කාරණාවට අවසන් තීරණය ලබා ගන්න.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රීවරුන් වන අප මහජනතාවට ඇති ප්‍රශ්න ඉදිරිපත් කරමින් තම තමාගේ අදහස් ද එකතු කරමින් සැණකෙළිය නැවැත්වීම සඳහා සභාව මඟින් තීරණයක් ලබාගෙන තිබුණා. මම ගරු සභාපතිතුමිය ලබාදුන් පිළිතුරෙන් පටන් ගන්නම්. ''සැණකෙළිකරුවන් උපකරණ සියල්ල ගෙනත්, දැන් කරන්න දෙයක් නැහැ, අපි සභා රැස්වීම අවසන් කරලා මේ පාරදිගේ ඇවිදගෙන යන වෙලාවෙම නැවැත්තුවාලු'' කියා දුරකථන ඇමතුමක් පැමිණෙනවා. මේ සම්බන්ධව කතාකළ ගරු මන්ත්‍රීන්ටම අදාල අය දුරකථන මගින් කතා කරනවා නම්, මෙහි සිට අදාල පුද්ගලයින්ට දුරකථන මගින් තොරතුරු ලබාදෙන්නේ කවුද? සභා කටයුතු පිළිබඳව ඔත්තු බලන්නේ කවුද කියන එක ප්‍රශ්නයක්. පළමුව මේ පිළිබඳව සොයා බැලිය යුතුයි. හේතුව මෙවැනි දේවල් නිසා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට තර්ජනයක් වෙනවා. ''මට ලක්ෂ හතක් පාඩු වුණා, ඒ නිසා මම වහ බොන්න යනවා'' කියන අය මිණීමරන්නේ නැහැ කියලා කොහොමද විශ්වාශ කරන්නේ? සූම් තාක්ෂණය ඔස්සේ තීරණ ලබාගැනීමේ තත්වයක් දැනට රටේ පවතිනවා. දුරකථන මගින් සාකච්ඡා කළ යුතු සභා කටයුතු පවත්වාගෙන යන්නේ කොහොමද? නීති රීති පද්ධතියක් තිබෙනවා. ඊට පරිබාහිරව කටයුතු කිරීම පිළිබඳ කුමන පියවරක් ගන්නවාද කියා ගරු සභාපතිතුමිය ගෙන් අහන්න බැහැ. මේ සඳහා නායකත්වය දුන්නේ ගරු සභාපතිතුමියමයි. ඒ නිසා නිරීක්ෂණ කටයුතු සිදුකරන නිලධාරීන් මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුයි. මුදල් කමිටුව විසින් ගන්නා ලද තීරණ මෙහි සිටින අනෙක් මන්ත්‍රීවරුන්ට වැරදි කරුණක් වශයෙන් හෝ එය ක්‍රියාත්මක කිරීමේදි ඇතිවන ප්‍රතිලාභ පිළිබඳව හෝ අනෙකුත් මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න කරන්න සිදු වෙනවා. රටේ දැනට පවතින තත්වය සහ ජනතාව මුහුණදෙන ගැටළු පිළිබඳව කල්පනා කරලයි මෙය අත්හිටුවන්න තීරණය කළේ. එසේ තිබියදී ගරු සභාපතිතුමියට හිතවත් අය වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීවරුන් මේ සඳහා කොටස් කරුවන් වෙලා සිටියාද කියන එක මම දන්නේ නැහැ. මටත් දුරකථන ඇමතුමක් ආවා. ජනතාවට පාක්ෂික වූ පිළිතුර මා සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඉන් මා කවදත් පසුබට වන්නේ නැහැ. ඔබගේ පිළිතුරත් එවැනි එකක් බවට මා සමග කතාකළ ගරු මන්ත්‍රීතුමාට මම පැවසුවා. ඊටත් එහා ගොස් කටයුතු කරනවානම් ඒ සඳහා වූ පිළිතුර ලබාදෙයි

කියලත් මා කියා සිටියා. අපගේ සභාවේ සභා කටයුතු වෙනත් අතකට යන බව මා පසුගිය වසරවල දී නිරීක්ෂණය කර තිබුණා. මෙම අවුරුද්ද තුල එය වැඩි වී තිබෙනවා. තවමත් විධිමත් සභා කටයුතු වලට අපි ප්‍රවේශ වෙලා නැහැ. ඒ නිසා කුමන කටයුත්තක් වුවද ගරු සභාපතිතුමිය තමාට පැවරී ඇති බලතල නිසි පරිදි භාවිතා කළ යුතුයි. අනෙකුත් පාර්ශවයන් සඳහා ඔබතුමියගේ තනතුරට අයත් බලතල වලින් පහත් තත්වයට වැටෙන්න එපා. සභා කටයුතු විධිමත්ව ක්‍රියාත්මක වියයුතු නම් සභාපති විධිමත් පරිදි කටයුතු කළ යුතුයි. එසේ නොමැතිව වෙනත් අය සඳහා නම්‍යශීලී වෙනවා නම් සභාව හරියට පවත්වාගෙන යන්න බැහැ. සභා කටයුතු නිරීක්ෂණය කරන නිලධාරීන්ගේ ලිපිය අපට බලන්න අවශ්‍යයි. තීරණයට පරිබාහිරව කටයුතු කිරීම පිළිබඳව වූ කාරණාව සොයා බලා පැහැදිලි කළ යුතුයි. අපි පරීක්ෂණ කමිටුවක් පත්කරන ලෙසට ඉල්ලා සිටිනවා. කුමන කමිටුවක් පත්කළාද? විමර්ශනය කළේ කුමක්ද කියා අපි දන්නේ නැහැ. සභා වාර්තාව සංශෝධන සමඟ අනුමත කරනවා. නමුත් සංශෝධන සහිත සභා වාර්තාව කෙදිනකවත් ඉදිරිපත් කර නැහැ. මෙහි කතා කරනවත් සමඟ අවසන් වෙනවා. ලිපි කවරයේ සදහන් භාෂා ගැටළුව පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කළා. සභාතිතුමිය විධිමත් පරිදි තමන්ගේ බලතල භාවිතා නොකර තමන්ගේ ධුර කාලය අවනස් කිරීමටයි යන්නේ. මේක තමයි ඇත්ත. අපට භාෂා අයිතිය ලබාදී තිබෙනවා. දෙවන භාෂාව රාජ්‍ය භාෂාව ලෙස තිබෙනවා. මෙම සභාවේ ද්‍රවිඩ මන්ත්‍රීවරුගේ වැඩි නියෝජනයක් තිබෙනවා. ලේකම්, සභාපති වැනි අයත් ඉන්නවා. අපේ අයිතිවාසිකම් අපි තහවුරු කරගන්නේ කවදාද? සභාපතිතුමිය තමාගේ රාජකාරිය සහ වගකීම තේරුම් අරගෙන ක්‍රියාකළ යුතු බවට මම ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මම කාටවත් නම්‍යශීලි වන කෙනෙක් නෙවෙයි. සමහර අවස්ථා වලදී කවුරුන් හෝ කෙනෙක් අපහසුතාවයට පත්වෙනවා නම් එම අපහසුතාවයට අපි හේතු කාරණා වෙන්න බැහැ. එනිසා තමයි කවුරු හෝ පැමිණ කතා කරන වෙලාවේ හරි කියලා කියා සිටින්නේ. කවුරු හෝ කෙනෙක් මෙහේ පැමිණ අපහසුතාවයට පත් වෙනවා නම් එයට සම්පූර්ණයෙන් වගකිව යුත්තේ මම තමයි. එවැනි අවස්ථා වලදී සමහර කරුණු කාරණා පිළිබඳව මම වගකීම භාර ගන්නවා. ඒ ඒ මන්ත්‍රීවරුන් සඳහා අදාල භාෂාවෙන් ලිපි ලැබී ඇති. නමුත් තැපැල් කටයුතු භාරව කටයුතු කරන නිලධාරීන් සහෝදර භාෂාවේ කෙනෙක් නම් එම නිලධාරීන් සහෝදර භාෂාවෙන් ලිපි කවර ලියන්න ඇති. ලිපිය දෙමළ භාෂාවෙන් ආවේ නැත්නම් එයට මම වග කියනවා. ඉදිරියේදී ලිපි කවරත් අදාල භාෂාවෙන් යොමු කරනවා. ගරු මන්ත්‍රීවරුන් අත්සන් කළ ලිපියේ පිටපතක් ලබා දෙනවා. අත්සන් නොකළ මන්ත්‍රීවරුන්ගේ අත්සන් ලබාගෙන පිටපත ලබා දෙන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙතෙක් හතර දෙනෙක් පමණයි අත්සන් කර තිබෙන්නේ. එහෙම නම් එහි පිටපතක් ලබාදෙන්න. දැන් අත්සන් කරන්න බැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

නැහැ. එදා දුරකථනය මගින් කතා කළ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් පසුව අත්සන් කර දෙන බවට පවසා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

නැහැ. මෙය විශාල ගැටළුකාරී තත්වයක ආරම්භයක් වේවි. හතර දෙනෙක් පමණයි අත්සන් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා පැවසූ අදහසට අමතරව මා කාරණාවක් පැවසිය යුතුයි. අදාළ අය උපකරණ ටික ගෙන ආ එක පිළිබඳව අපි කල්පනා කළා. නමුත් ගරු සභාවේ ලබාගත් තීරණයක් පිළිබඳව අපි කල්පනා කළේ නැහැ. අද මෙම ලිපියට අත්සන් කරනවානම් එය ගැටළුවක් මතු කරාවි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
තම තමන්ගේ කැමැත්ත අනුව අත්සන් කරන්න පුළුවන් නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අද අත්සන් කරන්න බැහැනේ. තීරණය ලබාගත් දිනයේදීම අත්සන් කර තිබුණානම් එය පිළිගන්න පුළුවන්. තවද භාෂාව පිළිබඳ ගැටළුවට ගරු සභාපතිතුමිය වැරැදි අදහසක් පිළිතුරක් වශයෙන් ලබා දුන්නා. මෙම කාරණාව ඔබතුමියට ගැටළුවක් වෙන්නේ නැහැ. ඔබතුමියට සම්බන්ධීකාරක වරයෙක් සිටිනවා. ලේකම්වරයෙක් සිටිනවා. ඒ අය ලිපි පරිවර්තනය කර දෙයි. නමුත් අපට මෙය ගැටළුවක්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ලිපිය දෙමළ භාෂාවෙන් නේද තිබෙන්නේ? කාර්යාලයේ තැපැල් කටයුතු සිදුකරන නිලධාරීන් සහෝදර භාෂාවට අයත් නම් ලිපි කවරය සහෝදර භාෂාවෙන් තියෙන්න ඇති. හැමදේම ගැටළුකාරී ආකාරයට බලන්න එපා. සිංහල භාෂාවෙන් යොමුකරන ලිපිවල පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදීමේදී භාෂා පරිවර්තනය කර ලබාදෙන ලෙසට පසුගිය සභාවේදී අපි පවසා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, මෙම කාරණාව ඔබතුමිය වැරැදි ආකාරයට තේරුම්ගෙන තිබෙනවා. අපට ලිපිවල පිටපත් ලබාදීමේදී එය භාෂා පරිවර්තනය කර ලබාදෙන ලෙසට අපි පැවසුවේ නැහැ. ලිපියක් යොමුකරන අවස්ථාවකදී දෙමළ භාෂාවෙනුත් එය යොමු කරන ලෙසටයි එදින අපි පැවසූවේ. එසේ නැතිව සහෝදර භාෂාවෙන් ලිපි යෙමුකර, එය භාෂා පරිවර්තනය කර දෙන්නම් කියන එකේ තේරුමක් නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මම යවන ලිපි මට කුමන භාෂාවකින් වුවත් යැවිය හැකියි නේද?

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවෙන් ලබා ගන්නා තීරණ වලට තමයි ලිපි යොමු කරන්නේ. පෞද්ගලිකව සෙන්බගවල්ලි මහත්මිය මගින් ලිපි යොමු කරන්නේ නැහැනේ?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔබතුමාට ලැබෙන ලිපි දෙමළ භාෂාවෙන් ලැබුණහම හරි නේද?

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
මෙම සභාවේ නාට්‍ය රඟපාන බවටයි මම අදහස් කරන්නේ. එදා මෙම කාරණාව යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කළේ ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා. මෙම සැණකෙළි උත්සවය කාගෙන් අහලද මෙහෙට ගෙනාවේ? මේ සදහා අනුමැතිය ලබා දුන්නේ කවුද? සවස් වරුවේ මෙය වෙනස් කර තිබෙනවා. මෙම කාර්යය සභාවේ වෙලාව නාස්ති කරන ක්‍රියාවක්. සභාව ආරම්භ කළ දා සිට මෙලෙසමයි සිදු වන්නේ. මේ සඳහා මෙතුමාට ඇමතුමක් ගොස් තිබෙනවා, අත්සන යොදන්න පොඩි ගානක් දෙන්නම් කියා. මෙවැනි පිළිකුල් සහගත වැඩ නැවැත්විය යුතුයි. මෙය සභාවේ පිළිගන්න බැහැ. සැණකෙළි උත්සවයේදී වැරැදි සිදු වී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම මස්කෙළිය නගරය කිසිම ප්‍රශ්නයකින් තොරව යුධ පිටියක් නොවේවා කියා සියළු දෙවියන්ගෙන් ප්‍රාර්ථනා කර සිටින අතර මෙහිදී කරුණු දෙකක් සාකච්ඡාවට ලක් වූවා. ඉන් එකක් අල්ලස් පිළිබඳවයි. සභාවේදී මනුෂ්‍යත්වයේ නාමයෙන් සමහර තීරණ ලබා දුන්නා. ගරු මන්ත්‍රී

රාජ්කුමාර් වශයෙන් මම මේ දක්වා කිසිම අල්ලසක් ලබාගෙන නැහැ. එසේ මා අල්ලස් ලබාගත් බවට ඔප්පු කළහොත් මම මේ මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වෙනවා. එකී සැණකෙළි උත්සවය භාරව කටයුතු කළ පුද්ගලයා මගේ කොට්ඨාශයේ කෙනෙක්. එදින සභාවේදී මමත් මෙම සැණකෙළි උත්සවය එපා කියලා තර්ක කළා. එදා මම කාරණා දෙකක් ඉදිරිපත් කළා. මුදල් කමිටුව එක්තරා තීරණයක් ලබාගන්නා අවස්ථාවේදීම එය පරිශීලනයට ලක් කරන්න තිබුණා. මුදල් කමිටුවෙන් තීරණය කර එය සභාවේ තීරණයට යොමුකර තිබුණා. සභාවේ තීරණයත් ලබා ගැනීමට පෙර ඒ අය ක්‍රීඩා පිටිය වෙන්කර ගෙන අවශ්‍ය උපකරණ සියල්ල ගෙනවිත් තිබෙනවා. වැරැද්ද සිදුවූ ස්ථානය පවසනවානම්, පළමුව මුදල් කමිටුවේ. මුදල් කමිටුවේ අනුමැතිය ලබා නොදී තිබුණානම් ඒ අය උපකරණ රැගෙන ඒන්නේ නැහැ. ප්‍රවාහන ගාස්තුද සමඟ මට රුපියල් ලක්ෂ තුනක් පාඩු වූවා කියා එක් අයෙක් අඬනවා. කෙනෙක් මානුෂිකව කාර්යයක් ඉල්ලා සිටින විට සහ තමන් සියදිවි හානිකර ගන්නවා කියා පවසන අවස්ථාවේ ඔහු සියදිවි නසා ගැනීමෙන් පසුව අපි ගොස් අවසන් ගෞරව දක්වන එකේ කිසි ප්‍රයෝජනයක් නැහැ. කවුරුන් හෝ අපහසුතාවයට පත් නොවිය යුතුයි කියා අපි කල්පනා කළා. කවරෙකුට හෝ පාඩුවක් නොවිය යුතුයි කියා කල්පනා කළා. නමුත් ඒ අය දැන් ලක්ෂ හයක් පාඩු වූවා කියා පවසනවා. අල්ලස් ගැනීම හෝ සාක්කු පිරවීමේ වැඩ මෙහෙ නැහැ. මා සමඟ දුරකථනයෙන් කතා කළ කෙනාගේ දුරකථන පටිගත කිරීම මා ළඟ තිබෙනවා. මා සමඟ කතා කළ කෙනා මගේ පාක්ෂිකයෙක් නෙවෙයි. මගේ විරුද්ධවාදියෙක්. නමුත් මානසිකව සලකා බලා තමයි අනුමැතිය ලබාදෙන ලෙසට අපි පැවසුවේ. වෙනත් කිසිදු අරමුණක් නැහැ. සභා කටයුතු වලින් ඔබ්බට ගොස් සභාවට අපහාස කළා සේ අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් අදහස් පළ කිරීම මම පිළිගන්නවා. ඒ පිළිබඳව මම තර්ක කරන්නේ නැහැ. එනිසා මේ කටයුත්ත සඳහා අනුමැතිය ලබාදුන් ගරු මන්ත්‍රී වරුන්ට අපහාස කරන්න එපා.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**

සැණකෙළිය පැවැත්වීම සම්බන්ධව මම පසුගිය සභා වාරයේදීත් කතා කළා. සැණකෙළිය ඉදිරිපත් කළ පුද්ගලයින් මම අඳුරන කෙනෙක් හෝ මගේ නෑදෑයෙක් හෝ හිතවතෙක් නොවෙයි. නමුත් ඔවුන්ට සාධාරණයක් විය යුතුයි. මුදල් කමිටුවෙන් අනුමැතිය ලබා දී, ප්‍රවේශපත් මුද්‍රණය කර, ක්‍රීඩා පිටිය වෙන්කරවා සියළු දේ අවසන් වූවායින් පසු සභාවට යොමුකර තීන්දු තීරණ ලබාගෙන, සභාපතිතුමිය විසින් පසුව පැවසුවා එහෙනම් මෙය නවත්වන්න කියා. එලෙස තීන්දු තීරණ ගන්න බැහැ. දෙපැත්තම බැලිය යුතුයි. ඒ පුද්ගලයින්ට සාධාරණයක් වෙනවාද? අසාධාරණයක් වෙනවාද? කියා. එසේ නොමැති නම් ලබාගත් මුදල් නැවත ලබාදිය යුතුයි. ඒ කිසි දෙයක් නොපවසා නවත්වමු කීවා. නවතා දමා යනවා කියන එක, ඒ අය කැඳවා මන්ත්‍රීවරු සමඟ සාකච්ඡාකර මෙහි තත්වය වටහා දී සභාවේ අවසරයක් නොමැති නිසා නැවැත්විය යුතුබව පැහැදිලි කර දියයුතුයි. ඒ පුද්ගලයින් කාර්යාලයට පැමිණ හඬා වැලපී පවසා සිටියා ලක්ෂ ගණනක් වියදම් කර තිබෙනවා. රටපුරා පෝස්ටර්, බැනර් ගසා ටිකට්පත් මුද්‍රණය කර තිබෙනවා, අපි දැන් මොකද කරන්නේ කියා. මනුෂ්‍යත්වයේ සත්කාරයක් වශයෙන් අපි ගරු සභාපතිතුමියට කතාකර පවසා සිටියා මේ අයට කුමක්ද කරන්නේ කියා. එවිට ඔබතුමිය පැවසුවේ මන්ත්‍රීවරුන්ගෙන් සහයෝගය ලබාදෙනවා නම් මට එහි ගැටළුවක් නැහැ කියා. ඉන් පසුවයි මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡාකර එම පුද්ගලයින්ට සාධාරණයක් වියයුතු නිසා ඒ දෙයට අපි කතා කළේ. අනික ඒ පුද්ගලයින් මුදල් දී තිබෙනවා නම් එය ඔප්පු කරන්න. අපි ඒවාට මුහුණ දෙන්න කැමතියි. මස්කෙළිය ප්‍රාදේශීය සභාවෙන් මෙවැනි දෙයක් සිදුකළා කියා නොකියන්නයි අපි මෙහෙම දෙයක් කළේ. සභාවට දවස් කිහිපයක මුදල් ගෙවා තිබෙනවා. සභාවට යම්කිසි ආදායම් මාර්ගයක් ලබා දී තිබෙනවා. එහි ගැටළුවක් වන්නේ ඒ අයටයි. එනිසා එවැනි චෝදනාවක් තිබෙනවානම් ඉදිරිපත් කරන්න. ඒ අයගේ දුක හඳුනාගෙනයි එම සිද්ධියට අපි කතා කළේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු සභාපතිතුමියනි, මේ තුළින් එක් කාරණාවක් පැහැදිලි වෙනවා. මෙහිදී ඔබතුමිය සිදු කළ යුතු සියලු දේ සිදුකර අවසන්ව බොරුවට තමයි මේ සභාවට ඉදිරිපත් කරන්නේ. ගරු මන්ත්‍රී තුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වෙන්නේ සියලුම දේ සිදු කර අවසන් බවයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)</u>**

ගරුමන්ත්‍රීතුමනි, සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී සහ මුදල් කමිටුවට ඉදිරිපත් කළ අවස්ථාවේ ඒ අය ක්‍රීඩා පිටිය පමණයි වෙන්කරගෙන තිබුණේ. සභාව අවසන් වූවායින් පසුව තමයි අදාල ටිකට්පත් මුද්‍රණය කරගෙන ආවේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

සභාව රැස්වී අපි අනුමැතිය දෙනවද නැද්ද කියන එකවත් නොදැන ඒ අය කොහොමද ටිකට් මුද්‍රණය කරන්නේ? එසේ නැතිනම් ඒ අය උපකරණ ටික ගෙනාවා, අනෙකුත් සියලුම සංවිධාන කටයුතු අවසන් කරලා තිබෙනවා, යනුවෙන් හරි සභාවට පවසන්න තිබුණා නේද? නමුත් තීරණයක් ලබාගෙන කටයුතු කර, පසුව එය වෙනස් කිරීමෙන් මේ සභාවට ඇති ගෞරවය කුමක්ද? එදිනම ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා දුරකථනයෙන් සම්බන්ධ කරගනිමින් විශේෂ සභාවක් පවත්වලා තීරණයක් ගන්න තිබුණා. එය සිදු නොකළ එක තමයි වැරදි කියලා අපි කියන්නේ. මෙහිදී අවසන් කාලවකවානුවේ හරි සභාව විසින් ගන්නා තීරණ වලට වැදගත් තැනක් ලබාදී කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමි. සිදු වූ වැරැද්ද පිළිගන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම සැණකෙළිය සම්බන්ධව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමැත්තෙමි. රටේ දැනට පවතින තත්වය හේතුකොටගෙන සැණකෙළි පවත්වන්න එපා කියලත්, ඒ සඳහා ඉදිරිපත් වන ප්‍රේක්ෂකයින් අපහසුතාවයට පත්වන බවත් එදින පැවසුවා. අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් පවසන පරිදි සැණකෙළි උත්සවය සභාවේ ගන්නා ලද තීරණයට ඔබ්බෙන් ගිහින් සිදු කළ එකක් බවට මම නිහතමානීව පිළිගන්නවා. මෙහිදී මුදල් ලබා ගත්තා කියන ප්‍රකාශය ඉල්ලා අස්කර ගත යුතුයි. සභාවේ කවුරුවත් මේ සඳහා මුදල් ලබා ගත්තේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

පසුගිය මාසයේ 08 වැනි දින මෙම සැණකෙළි උත්සවය පිළිබඳව ලිපියක් ලැබී තිබුණා. සභාවට ආදායමක් ලැබෙන මෙම අවස්ථාවේදී සැණකෙළි උත්සවය සඳහා අනුමැතිය ලබාදෙමු යැයි එදින මුදල් කමිටුවට පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. පසුව එම කාරණාව සභාවට ඉදිරිපත් කළා. එදින මෙම කාරණාව පිළිබඳව සියලුම ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. පසුව රටේ පවතින අසාමාන්‍ය තත්වය හේතුකොට ගෙන , නැවත රට යථා තත්වයට පත්වන තෙක් මෙවැනි කරුණු සඳහා අනුමැතිය ලබා නොදෙන බවටත් තීරණය කළා. මටත් මේ සම්බන්ධව දුරකථන ඇමතුම් ලැබුණා. මම මේ සඳහා අනුමැතිය ලබා නොදෙන බවට පැවසුවා. පසුව නගරයේ වෙළෙඳුන් මේ කාරණාව පිළිබඳව විමසුවා. එසේ සැණකෙළි උත්සවය පවත්වන්නේ නම් ඊට විරුද්ධව උද්ඝෝෂණ පවත්වන බවටත් පැවසුවා. එසේ උද්ඝෝෂණ පවත්වන්න එපා. වරදක් සිදු වී තිබෙනවා නම් ඊට සමාවන ලෙසට මා ඉල්ලා සිටියා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)</u>**

කෙනෙක් අපහසුතාවයට පත්වීම වළකාලීම සඳහා ගන්නා ලද තීරණයක් විතරයි. එසේ නොමැතිව සභාව විසින් ගන්නා ලද තීරණය පැහැර හැරීමක් කළේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මේ පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කරමින් මෙම කාරණාව අවසන් කළ හැකි බවට මම අදහස් කරනවා. මේ කාරණාවේ මගේ නමත් සඳහන් වුණා. මස්කෙළිය නගරය සඳහා මේ සම්බන්ධයෙන් මා සැණෙකෙළි උත්සවයේ අදාළ අයිතිකරු සමග ගැටළු ඇති කරගත් හඬ පටිගත කිරීමත් මා ළඟ තිබෙනවා. මෙම සිද්ධිය සම්පූර්ණයෙන්ම වැරැදි බවට ගරු සභාපතිතුමිය පිළිගත යුතුමයි. ලබාගන්නා ලද තීරණයට පිටුපා කටයුතු කිරීම වැරැදි බවට පිළිගත යුතුයි. එම හඬපටයේ අසභ්‍ය වචන වලින් කථා කර තිබෙනවා. නැතිනම් මම එම හඬපටය ක්‍රියා කරවා පෙන්වනවා. මෙම කාරණාව පිළිබඳව තවදුරටත් කථා කරන්න එපා. මා දන්නා විදිහට මෙයට සම්බන්ධ පුද්ගලයා හැටියට මස්කෙළිය නගරයේ අයෙකුගේ නමක් පෙන්වා දිය හැකියැයි කියා මම හිතනවා. නගුලේෂ්වරන් කියන පුද්ගලයා සමග සම්බන්ධ වී ඔහු මගින් මෙම කාරණාව ගෙන ආ බවට බොහෝ දුරට කියවෙනවා. මෙය ඇත්තද බොරුද කියන එක මෙම හඬපටයේ තිබෙනවා. මෙලෙස බොහෝ තැන් වලට ගොස් කථා කර තිබෙනවා. එනිසා සභාවේ සිදුවන දේවල් පිළිබඳව සභාවේ ගරු මන්ත්‍රීවරුන් සමඟ මෙම ස්ථානයේම අවසන් කර ගන්න එක සුදුසුයි කියා හිතනවා. නැතිනම් සභාව අපකීර්තියට පත් වෙනවා. වැරැදි ඇතුළත් සභා වාර්තාව නිවැරදි බවට මා යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 01**
2022. 04.11 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මෙම සභා වාර්තාව වැරැදි නැහැ. මෙම කාර්යය සිදු කළොත් බලපෑමක් ඇතිවන බවට කතා කළ කරුණු සඳහන් වෙනවා. නමුත් පිටතදී මෙය කොන් කරලා තිබෙනවා. සභාවේ තීරණයට අපහාස කර තිබෙන බවට ප්‍රකාශ කරමින් ඒ සඳහා පරීක්ෂණයක් අවශ්‍ය බවට අපි තීරණය කරනු ලබනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රී පී. ආනන්දරාජ් මැතිතුමා විසින් පවසන ලද අල්ලස් ලබා ගැනීම පිළිබඳ කාරණාව ඔප්පු කළ යුතුයි. මේ පිළිබඳව ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කළ යුතුයි. හේතුව මේ සියල්ල සභාවේ වාර්තාගත වෙනවා. ගරු සභාපතිතුමිය වශයෙන් මම මෙතෙතක් කිසි අයෙකුට අතපා නැහැ. එමෙන්ම අල්ලස් ලබාගැනීමේ චෝදනා වලට සම්බන්ධ නොවූ ගරු මන්ත්‍රීවරුන් මෙතන සිටිනවා. එතුමන්ලාගේ කීර්ති නාමයටත් අපහාසයක් සිදු වෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අද දින ගරු මන්ත්‍රීතුමාගෙන් ලිපියක් ඉල්ලා සිටින පරිදි අපිත් විවිධ ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා. ඒ සියලුම දෙනා ලිපි ලබා දුන්නොත් කුමක්ද සිදු වන්නේ?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)</u>**
අද දින මාගේ විශේෂ කථාව ශ්‍රී ලංකා පළාත් පාලන සම්මේලනය සහ කැනඩාවේ පළාත් පාලන ආයතනය සම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක කරන වැඩ සටහන පිළිබඳවයි. මෙම වැඩ සටහනට ඇතුලත්වීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටි පළාත් පාලන ආයතන 512 ක් ඉල්ලුම් කර තිබුණා. එයින් පළමු වටය සඳහා පළාත් පාලන ආයතන 12 ක් තෝරාගෙන තිබුණා. ඒ අතරට අපගේ සභාවද

ඇතුලත් වී තිබුණා. පසුව අවසන් වරට තෝරාගැනීමේදී ශ්‍රී ලංකාව තුල පිහිටි පළාත් පාලන ආයතන වලින් පහෙන් එකක පළාත් පාලන ආයතනයක් වශයෙන් අපගේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවද තෝරාගෙන තිබෙන බවට ඔබ සියළු දෙනා වෙත ඉතාමත් සතුටින් දන්වා සිටිමි. මෙම වැඩ සටහනේ ආරම්භක අවස්ථාවක් වශයෙන් 2022.05.09 වන දින එකී ආයතනයේ නිලධාරීන් විසින් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් සමඟ පැහැදිලි කිරීමේ සාකච්ඡාවක් සිදුකළ අතර හඳුන්වාදීමේ වැඩසටහනක් ද සිදු කෙරිණි. එම අවස්ථාවේදී එකී වැඩසටහන පිළිබඳව සම්පූර්ණ පැහැදිලි කිරීමක් ද සිදු කරන ලදී. මෙම වැඩ සටහන අවුරුදු 06 කට අපගේ ප්‍රාදේශීය සභාව තුල සිදු කිරීමට නියමිතයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තා දේශපාලනය ප්‍රවර්ධනය කිරීම, පසුගාමී ප්‍රජාවන්ගේ සංවර්ධන සහ මූල්‍ය ආධාර ලබාදීම වැනි විවිධ ව්‍යාපෘති සඳහන් කෙරුණි. ඒ සමඟම මෙම වැඩසටහන අප සභාවේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය බලාපොරොත්තු වේ. එනිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිමි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා අපගේ සභාව තෝරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ ගරු මන්ත්‍රීවරුන්, ලේකම්තුමා ඇතුළු කාර්යාලයේ නිලධාරීන් සියළු දෙනාටම මාගේ ස්තූතිය සහ සුභාශිංෂණය පිළිගන්වමි. තවද මෙම ව්‍යපෘතිය සඳහා අප සභාව තෝරා පත්කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ එකී ආයතනයේ තේරීම් කමිටුව ද පළාත් පාලන ආයතන සම්මේලනයේ ක්‍රියාකාරී නිලධාරින්ටද විධායක අධ්‍යක්ෂකතුමාටද අනෙකුත් ව්‍යාපෘති භාර නිලධාරී වරුන්ටද මාගේ ස්තූතිය පුදකර සිටිමි.

<u>**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>

මෙම කාරණාව පිළිබඳව පසුගිය 09 වැනි දින පැවති රැස්වීමට මාද සහභාගී වී සිටියා. මෙම කාරණාව අගය කොට සලකන අතර ඇත්තෙන්ම මේ සඳහා ස්තූති කළ යුතුයි. ශ්‍රී ලංකාව පුරා පිහිටි පළාත් පාලන ආයතන වලින්, ආයතන පහක් අතරට මස්කෙළිය ප්‍රාදේශීය සභාවත් තෝරාගැනීම පිළිබඳව මාගේ ස්තූතිය පුදකරමි. මෙය සභාව මඟින් සිදු කරන ව්‍යාපෘතියක් බැවින්, අවංකභාවයෙන් සහ ජනතාවට ප්‍රයෝජනයක් වන පරිදි මෙහි සේවාවන් සිදුවිය යුතුයි. මේ සඳහා අප පූර්ණ සහයෝගය ලබාදෙන අතර මෙම ව්‍යාපෘතිය අපේ සභාවට ලබාදීම පිළිබඳව එකී ආයතනයටත් මාගේ ස්තූතිය පුදකරමි.

<u>**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**</u>

මෙම ව්‍යාපෘතිය සඳහා අපගේ සභාවත් ඇතුළත් කර ගැනීමට පූර්ණ වශයෙන් කැපවීම් කළ ලේකම්තුමාට සුභ පතන්න අවශ්‍යයි. හේතුව එම ආයතනයෙන් ලබා දී තිබුණු ඉතාම කෙටි කාලය තුළ සියලුම කටයුතු අවසන් කර නියමිත තොරතුරු ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙනුයි අපගේ සභාව තෝරාපත්කර තිබෙන්නේ. තවද අපගේ සභාවේ සභාපති වශයෙන් කාන්තා නියෝජනයක් පවතින බැවින් ද අපගේ සභාව තෝරාපත්කර ගන්න ඇති. මෙම ව්‍යාපෘතිය යටතේ අවුරුදු හයක් ඇතුලත සිදුවන සියලුම කාර්යයන් සඳහා ගරු මන්ත්‍රීවරුන් වන අපගේ දායකත්වය ලැබේවි.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**</u>

එදින රැස්මේදී සභාවට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධ කරුණු සාකච්ඡාවට ලක් වුවා. එනිසා ඊට අවශ්‍ය ලිපි ලේඛන සකස්කර දෙන්නේනම් එය යහපතක් වේවි.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>

එවැනි ලිපි ලේඛන සකස් කිරීම සඳහා ඉංජිනේරු වරයකුගේ සේවාව ලබාගත යුතු වේවි. ඒ සඳහා ද සභාවේ අනුමැතිය ලබාගත යුතුයි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එදින ඉඩම සම්බන්ධව මම අදහස් පළ කළා. එම ඉඩම ලබා ගැනීම සඳහා අපට කිසිවක් කරන්න බැරි වේවිද?

**තීරණ අංක 02**
අදාළ ව්‍යාපෘතිය සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඊට අවශ්‍ය කටයුතු සියල්ල සිදුකර අවසන්. මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
**යොමු කරන්නා :-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අඹගමුව කෝරළය.
**විෂය:-** ජංගම සේවාව පිළිබඳ වූ ලිපිය.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේ පිළිබඳව පෙබරවාරි මාසයේ පමණ මම යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. ඒ අනුව ඔබතුමිය සභාවෙන් ලිපි යොමු කර තිබුණා. එම ලිපියේ පිටපතකුත් මාහට ලැබුණා. පසුගිය අවුරුද්දේ බ්‍රවුන්ලෝ ඉඩම සම්බන්ධවත් මම යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා ද කටයුතු සිදු කර තිබෙනවා. සභාවට දොස් පවරන පුද්ගලයා මම නෙවෙයි. ඉහත කරුණු සඳහා සභාවට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාගේ ස්තූතිය පලකර සිටිනවා. මෙම ජංගම සේවාව සඳහා අවශ්‍ය සියලුම සහයෝගය අපි ලබාදෙන බවට ප්‍රකාශකර සිටිමි.

**ලිපි අංක 02**
**යොමු කරන්නා :-** පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
**විෂය:-** ගරු මන්ත්‍රීවරුන්ගේ තොරතුරු ලබා ගැනීම පිළිබඳ වූ ලිපිය

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මෙතෙක් දේපළ පිළිබඳ තොරතුරු ලබා නොදුන් ගරු මන්ත්‍රීවරුන් වහාම එම තොරතුරු ලබා දීමට කටයුතු කරන්න. මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම සිදුවිය.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් හට වෙන්කරන ලද ප්‍රතිපාදන සඳහා වූ ව්‍යාපෘතිය වහාම ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කමිටුවේ දී සාකච්ඡා කර තිබෙනවා. මේ සඳහා මුදල් කමිටුවට මාගේ ස්තූතිය පුදකරමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අත්‍යාවශ්‍ය ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කරන ලෙසට මුදල් අමාත්‍යාංශයෙන් දැනුවත් කිරිමක් කර තිබෙනවා. එනිසා එවැනි කරුණු පිළිබඳවත් අවධානය යොමු කරන්න.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඒක තමයි, එවැනි පැහැදිලි කිරීම් සභාවෙන් ලබාදිය යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ජනතාවට ඉතාමත් අත්‍යාවශ්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
2022.05.09 වන දින පැවති මුදල් කමිටු වාර්තාවේ විෂය අංක 03 යටතේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කංකානම් වශයෙන් රාජකාරී කරන එස්.ආනන්දන් මහතා පිළිබඳව කරුණු සාකච්ඡා කර පරීක්ෂණයක් සිදුකිරීම සම්බන්ධව තීරණයක් ලබාගෙන ඇත. ඔහු පිළිබඳව පැමිණිල්ල කුමක්ද? එම පැමිණිල්ල ලිඛිතව ලැබී තිබෙනවාද? එසේ නොමැති නම් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය යුතුයි. මුදල් කමිටුව තීරණයක් ලබාගෙන තිබෙනවා. නමුත් ප්‍රශ්නය කුමක්ද කියන එක පිළිබඳව සඳහන් කළ යුතුයි. එක් නිලධාරියෙක් පිළිබඳව මුදල් කමිටුවේ පැහැදිලි තීරණයක් ලබාගෙන තිබීම පිළිබඳව අගය කරන අතර ඔහුට ඉදිරිපත්කර ඇති චෝදනා මොනවාද කියන එක පිළිබඳව ද සොයා බැලිය යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
නිලධාරියෙක් පිළිබඳව චෝදනා ඔප්පු කරන තුරු කිසිවක් සිදු කරන්න බැහැ. පරීක්ෂණ දිනයේදී එය ඔප්පු කළහොත් පරීක්ෂණ නිලධාරී මඟින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියනි, කාර්යාලයේ නිලධාරියෙක් පිළිබඳව පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවේදී ඒ පිළිබඳව මුදල් කමිටුව මඟින් සාකච්ඡා කරනවාද? නැතිනම් පෞද්ගලිකව පරීක්ෂණ කමිටුවක් පත් කරනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මෙහෙම සිදුවීමක් වී තිබෙනවා. ඒ සඳහා පරීක්ෂණ සිදුකරන ලෙස පවසා තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මෙම කරුණ මුදල් කමිටුවට ඉදිරිපත්වීමට හේතු වූ කාරණාව කුමක්ද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
අතිකාල දීමනා ගෙවීම සම්බන්ධව මුදල් කමිටුවේ සාකච්ඡා කළ අවස්ථාවේ මෙම කරුණ ඉදිරිපත් කළා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ඔහු කාර්යාලයේ සේවය කරන නිලධාරියෙක්. එනිසා එම කාරණාව සභාවට ඉදිරිපත් කළා නම් එය පොදු කාරණාවක් නේද? දැන් ඔහුගේ නම ඉස්මතු කර නේද අපි කතා කරන්නේ. මේ නිසා ඔහුගේ ආත්ම ගරුත්වයටද ගැටළුවක් වෙනවා නේද? ඔහුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. නමුත් එය සභා පරිපාලනය තුලයි තිබෙන්නේ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
සභාවට ආවේ නැහැ. මුදල් කමිටු සාමාජිකයන් සඳහා ලැබුණු ලිපියක්. එය මුදල් කමිටුවට ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**
මෙම කාරණාව මුදල් කමිටුවේ සාකච්ඡා කිරීම සඳහා මුදල් කමිටුවට ලිපියක් ඉදිරිපත් කළාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මුදල් කමිටුවේ සාමාජිකයෙකු සඳහා මේ පිළිබඳව ගැටළුවක් ලැබී තිබෙනවා. එනිසා ඒ පිළිබඳව කමිටුවට ඉදිරිපත් කළා. මේ සම්බන්ධව පරීක්ෂණ සිදුකරන අවස්ථාවේ එකී මන්ත්‍රීවරයා එය ඔප්පු කරයි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
දීර්ඝ වශයෙන් සියළු කරුණු සඳහා ගැටළු ඇතිකර ගැනීම සඳහා අපි අහන්නේ නැහැ එය පළමුව මා සඳහන් කළ යුතුයි. පසුගිය අවුරුදු හතරකදී ම මුදල් කමිටු වාර්තාව අපි බලා තිබෙනවා. නිලධාරියෙක් පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබාගෙන නැහැ ඒ සියල්ල ලේකම්තුමා යටතේ ලබාගත යුතු තීරණ විය යුතුයි. එක්තරා නිලධාරියෙකුට විරුද්ධව පැමිණිල්ලක් ඉදිරිපත් වන අවස්ථාවේදී එය මුදල් කමිටුවේ සාකච්ඡා කරන්න පුළුවන්. එය පරීක්ෂණයක් සඳහා යොමු කිරීමට නිත්‍යානුකූල අයිතියක් කමිටුවට නැහැ. එය සභාවට පැමිණිල්ලක් වශයෙන් ලැබෙන අවස්ථාවේදී ඒ පිළිබඳව සභාවේ තීරණයක් ලබාගත හැකියි. මුදල් කමිටුවට තීරණයක් ලබාගන්න බැහැ. මම පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා නම් මට ඒ පිළිබඳව කියන්න පුළුවන්. සභා වාර්තාවේ ඇතුලත් කරන අවස්ථාවේ එය ලේඛනයක් වශයෙන් පෙන්වන්න පුළුවන්. අනික් පැත්තෙන් ඉදිරිපත් කරයි කියන එක සභාවට ගැලපෙන්නේ නැහැ. මෙහිදී පරිපාලනය භාරව කටයුතු කරන ලේකම්තුමා මේ සඳහා වූ සුදුසු ක්‍රියාමාර්ගය කුමක්ද යන්න පැහැදිලි කළා නම් එය අපට පිළිගත හැකියි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
සෞඛ්‍ය කංකානම් පිළිබඳව කරුණු සාකච්ඡා වී තිබෙනවා. සභාව ආරම්භ කර අවුරුදු ගණනකට, නමක් සඳහන් කර ඔහු වැරැදිකරු යැයි පවසා මෙහිදී තර්කයකට යන්නේ නැහැ. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකුත් නම් සඳහන්කර කතා කරන්න එපා කියා පවසා තිබෙනවා. පළමුව එකී පුද්ගලයා වැරැදිකරු යන්න සාක්ෂි තිබෙනවාද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ගරු මන්ත්‍රීතුමා එකී කාරණාව මුදල් කමිටුවට ඉදිරිපත් කරන අවස්ථාවේ “මට ඡන්දය දුන් මහජනතාව මට පැමිණිලි කර තිබෙනවා කියා එම පැමිණිල්ල මෙහිදී නේද ඉදිරිපත් කරන්න පුළුවන්” කියා කීවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
අදාල පුද්ගලයාට විරුද්ධව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. මෙහිදී අනෙකුත් නිලධාරීන් ලිපි ලබාදේවිද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ලබාදෙයි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
හෙට දිනයේ දී මෙය පරීක්ෂණයට සඳහා පැමිණෙන අවස්ථාවේදී අදාල පුද්ගලයා ලිපිය ලබා නොදුන්නොත්, සභාව විගඩම් කරන ස්ථානයක් වෙයි නේද?.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
සාක්ෂි නොමැතිව ඉදිරිපත් කරන්නේ නැහැ නේද?

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කාරණාව මුදල් කමිටුවේදී සාකච්ඡා කළ පසු ඔබතුමිය සහ ලේකම්තුමා එක්ව එකී පුද්ගලයාගෙන් විමර්ශනයක් සිදුකර ඉන් පසුව මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන්න තිබුණා. දැන් පරීක්ෂණයෙන් අනතුරුව එකී පුද්ගලයා වැරැදි කරුවෙකු බවට හෙළි වුවහොත් අපි සියළුම දෙනාට හිස නමන්න සිදු වෙනවා. සභාවේ යහපත් නිලධාරීන් බොහෝ දෙනෙක් සිටිනවා. සමහර නිලධාරීන් පිළිබඳව පැමිණිලි ලැබී තිබෙනවා. අපි මුදල් කමිටුවේ සාමාජිකයන් ලෙස සිටි අවස්ථාවේ මෙවැනි පැමිණිලි ඉදිරිපත් කර තිබුණානම් දැනට බොහෝ නිලධාරීන් මෙහි සිටින්නේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
සෞඛ්‍ය කංකානම් එස්.ආනන්දන් මහතා වැඩිපුර වැඩ කර තිබෙන නිසා සභා අරමුදලෙන් අතිකාල දීමනා ගෙවා තිබෙනවා. නමුත් ගෙවීම් කර ඇති මුදලට අනුව ඔහු වැඩ කළේ නැති බවට මහජනතාවගෙන් පැමිණිලි ලැබී තිබෙන නිසා තමයි මුදල් කමිටුවේ මෙම කාරණාව සාකච්ඡාවට ලක්වුණේ. මගේ තර්කය නම් ඔහු වැඩිපුර වැඩ කළේ නැතිනම් ඔහුට ඇයි ලේකම්තුමා අතිකාල දීමනාවක් ගෙවා සිටියේ.

(සභාපතිතුමියගේ අනුමැතිය මත ලේකම් තුමා විසින් පිළිතුරු ලබා දෙන ලදී.)

**<u>ලේකම්තුමා</u>**
ඔහු වැඩකර තිබෙනවා. ඒ නිසා තමයි මම ඔහුට අතිකාල දීමනා ගෙවුවේ. නමුත් ඔහු වැඩකර නොමැති බවට මහජනතාව පැමිණිලි කර තිබෙනවා කියා මුදල් කමිටුවේ සාමාජිකයන් පවසන නිසා මෙම කාරණාව පරීක්ෂණයට ලක්ව තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
එසේ නම් ඔහු වැඩකර ඇති බවට මුදල් කමිටුවට කරුණු පැහැදිලි කරන්න තිබුණා නේද?

**<u>ලේකම්තුමා</u>**
මම පැහැදිලි කර තිබුණා. ඒ සමඟම ඔහු පිළිබඳව වෙනත් චෝදනා තිබෙන බවටත් පවසන නිසා පරීක්ෂණයට යොමුකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
හරි, එම පරීක්ෂණයෙන් අනතුරුව ඔහු වැරැදි කරුවෙකු බවට ඔප්පු වුවහොත් අතිකාල දීමනාව සඳහා අනුමැතිය ලබාදුන් ඔබතුමා වැරැදි බවද පිළිගත යුතුයි.

**<u>ලේකම්තුමා</u>**
ඔව්. එවැනි අවස්ථාවලදී මාගෙන්ද අයකිරීම් කරනු ලබනවා.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
ගරු සභාපතිතුමියට ලැබී ඇති බලතල භාවිතා කරමින් පළමුව මේ පිළිබඳව විමර්ෂණයක් සිදු කර ඉන් පසුව එය සහකාර කොමසාරිස්තුමා වෙත දැනුම් දෙන්න තිබුණා. කෙළින්ම සහකාර කොමසාරිස්තුමා වෙත යොමු කිරිම වැරැදියි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මෙම කාරණාව පිළිබඳව අදාල නිලධාරියා ගෙනවිත් මම කිහිප වතාවක්ම කතාකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

විෂය අංක 03 හි සදහන් නිර්දේශය සඳහා අපි සම්පූර්ණ සහයෝගය ප්‍රකාශ කර සිටින අතර ලිඛිතව කරුණු අන්තර්ගත කිරීම සඳහා තීරණ අංක 03 සඳහා අපි පූර්ණ සහයෝගය ලබා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මෙම කාරණාව මෙන්ම මුදල් කමිටුව සඳහා ලැබෙන වෙනත් පැමිණිලි සම්බන්ධව ද එම පැමිණිලි භාරගෙන අදාල පුද්ගලයන් පිළිබඳව මෙලෙසින්ම කටයුතු කළ යුතුයි. තවද විෂය අංක 06 යටතේ 2022 වර්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ලබා දෙන්නේ කුමන පදනමෙන්ද? යන්න කඩිනමින් ලබා දෙන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ජනතාවට අත්‍යාවශ්‍යම වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මේ පිළිබඳව තවත් අදහසක් ප්‍රකාශකර සිටින්නම්. 2021 වර්ෂයේදී මාහට වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතුවී තිබුණා. එනිසා ඒ සඳහා වෙනත් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. මට මේ සඳහා ඇති ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දෙන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නව අග්‍රාමාත්‍ය තනතුරට පත් වූ අපගේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභ පතන අතර රටේ උද්ගතවී ඇති ආර්ථික ගැටළුව මත රට අර්බුධකාරී තත්වයකට පත්ව ඇත. අපගේ සභාවේ වැය වාර්තාවේ විවිධ කාරණා සඳහා මුදල් වැයකර ඇතිබව සඳහන් කර තිබෙනවා. අතිකාල දීමනා සඳහා අපි විශාල මුදලක් වැය කරනවා. ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසට මම ගරු සභාපතිතුමියගෙන් ඉල්ලා සිටිනවා. මම පෞද්ගලිකව කවරෙකු හෝ සදහන් කර සිටින්නේ නැහැ. සභාව ආරම්භ කළ කාලයේ සිට මේ දක්වා නිලධාරීන් සංඛ්‍යාව වැඩි වී තිබෙනවාද? නැතිනම් අඩු වී තිබෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ඩැඩි වී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

නගර අලංකරණය කර එය නඩත්තු කිරීම අප සභාවේ විශාල වගකීමකි. වැසිකිළි කසළ අපහරණය කිරීම සඳහා අවශ්‍යම යන්ත්‍රෝපකරණ පසුගිය අවුරුදු හතරක්ම අපි ළඟ නැහැ. අපි කීප වතාවක් විමසා සිටියා. නමුත් මේ දක්වා අපට එය ලබාගත නොහැකි වුවා. අපගේ සේවාව කුමක්ද කියා පළාත් පාලන කොමසාරිස්තුමා දන්නවද දන්නැහැ. කිහිපවතාවක්ම ඉල්ලුම් කළත් එය ඉටුකර දුන්නේ නැහැ. එනිසා අපට ජනතාවට මුහුණ දෙන්න බැරි වී තිබෙනවා. ජනතාවට අවශ්‍ය ගලී යන්ත්‍ර විශාල මුදලක් වැයකර වෙනත් ප්‍රදේශ වලින් ඒ අයම ගෙන්වා ගන්නවා. පී.ෂන්මුගරාජ් රු.8000.00 ද,ඩේවිඩ් රු. 5000.00 ද, රුෂාණි සෙව්වන්දි රු.4000.00 ක් පමණ වශයෙන්. මෙහිදි අපි දකින ගැටළුව වන්නේ කරුණාතිලක රු.3000.00 යි. කරුණාතිලක රු.1500.00 යි. මේ අයගේ රැකියාව කුමක්ද? සෙව්වන්දි කියන නිලධාරියා කළමනාකරණ සහකාර කියන තනතුරෙන් එතැනට ගියත් අපි දීමනා ගෙවන්න අවශ්‍යද? අපගේ ලේකම්තුමා නිවාඩු දිනවලත් කාර්යාලයේ සිටිනවා. මස්කෙළිය, සාමිමලේ පුවත්පත් සඳහා රු.20000.00 ක් ගෙවනවා. දැන්

පුවත්පත් කියවන්න කවුරුන් හෝ පැමිණෙනවාද? ගරු සභාපතිතුමියගේ වාහනය සඳහා රු.90000.00 ක් ගෙවනවා. ගරු සභාපතිතුමියගේ රියදුරු සඳහා රු.36000.00 ක් පමණ ගෙවනවා. සම්බන්ධීකරණ ලේකම්තුමාහට රු.25000.00 ක් ද ගමන් වියදම් සඳහා රු.10000.00 ක් ද ගෙවනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මම රැස්වීම් සඳහා පිටතට යන අවස්ථාවලදී මම කෑම කන්නේ නැද්ද? රියදුරුට කෑම අරන් දෙන්නේ නැද්ද?

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
කාර්යාලයේදී අතිරේකව පොඩි වැඩක් කළත් ඒ සඳහා දීමනා ලබා දෙනවානම් එහි තේරුම කුමක්ද? කවුරුන් හෝ අයෙක් ඔහුගේ වැටුපත් ලබාගෙන අතිරේක දීමනා වශයෙන් රු.25000.00 කුත් ලබාගන්නවා නම් කුමක්ද එහි ඇති සාධාරණය? අපගේ සභාවේ සියළුම දෙනා නෙවෙයි සමහරු බාගෙට බාගයක් නිකන් තමයි ඉන්නේ. CCTV කැමරා පද්ධතියක් සවි කරන්න කියා කීවා. එයත් සවි කළේ නැහැ. ඉස්සර ගිනිගත්හේනට ගොස් පහසුවෙන් කර ගෙන ආ වැඩ දැන් අපේ සභාවේ දී අපේ නගරයේ අයට මාස 06 ක් අවුරුද්දක් ගතවෙලත් කරගත නොහැකි වී තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන්හට කෙළින්ම ගොස් නිලධාරීන්ට කතා කරන්න බැහැ. එයයි නීතිය. ගරු සභාපතිතුමිය, ලේකම්තුමා, ප්‍රධාන කළමනාකරණ සහකාර වැනි අය කවුරුන් හෝ නොමැති විට අපට අදාළ නිලධාරීන් ළඟට යන්න සිදු වෙනවා. නමුත් අපට ගරු කළ යුතුයි නේද? ජනතාවට සේවය කරන්න නේද අපි ඉන්නේ? වැඩ කරන අය බොහොමයක් සිටිනවා. සමහර නිලධාරීන් තමන්ගේ කැබින් එක දුර්භාවිතා කරනවා. මේවා ඇත්ත. මින් ඉදිරියට හෝ ගරු සභාපතිතුමිය, ලේකම්තුමා, මේ පිළිබඳව අවධානය යොමු කරන්න. නායකත්වයෙන් අපි ඉතා දුර්වලයි. ගරු සභාපතිතුමිය, ලේකම්තුමා, නොමැති අවස්ථාවලදී යම්කිසි හදිසි කාර්යයක් සඳහා පැමිණෙන අපි කාවද හමුවන්නේ? මෙය විශාල ගැටළුවක්. මෙතරම් පහසුකම් ලබා දී, අතිකාල දිමනාද ලබා දී, ඔවුන් 3.30 බස් රථයේ යනවා නම් කුමටද අතිකාල දීමනා ගෙවන්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමා පවසන කරුණු සඳහා සියළුම නිලධාරීන් පෞද්ගලිකව ගෙන්වා ලේකම්තුමා ඉදිරියේ මා පවසා තිබෙනවා. මම මේවා ගැන බලන්නේ නැතිව නෙවෙයි. මම නොමැති අවස්ථාවලදී කොහොමද කියා දන්නේ නැහැ. මින් ඉදිරියට ඒ ගැන බලන්නම්.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගෙවීම් වාර්තාවේ තාවකාලික සේවකයන් 11 දෙනෙක් සඳහා වේතන ලබා දී තිබෙනවා. එහි කසළ කළමණාකරන කටයුතු සඳහා කී දෙනෙක් සිටිනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අට දෙනෙක් සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඒ අයට අපි අතිකාල දීමනා ගෙවනවාද? නැහැනේ. කසළ කළමණාකරන වැඩ කටයුතු සිදු කිරීම අපගේ සභාවේ ප්‍රධාන කාර්යයක්. ඒ අනුව එම 08 දෙනා හොඳින් වැඩ කරනවා. නමුත් ඒ අය සඳහා පත්වීම් ලිපි ලබා දී නැහැ. ඒ අය වේතනයට වඩා වැඩියෙන් සේවය සපයනවා. කොවිඩ් 19 කාලයේ දී අපි ගෙදර සිටියා. නමුත් එම පුද්ගලයින් සේවය සඳහා පැමිණියා. එක් පුද්ගලයෙකු සඳහා රු.12000.00 බැගින් අතිකාල දීමනා දෙනු ලබනවා. එනිසා තාවකාලික සේවකයින් සඳහාත් කුමක් හෝ සිදු කළ යුතුයි. ඒ අයට මෙතෙක් පත්වීම් ලබා දී නැහැ. පත්වීම් ලැබුණහොත් පමණයි

අනෙක් වරප්‍රසාද හිමිවන්නේ. මුදල් කමිටු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ගෙවීම් වාර්තාවේ වියදම් වැඩිබව පවසා සිටිනවා, අනෙක් වියදම් අඩුකළාට කමක් නැහැ නමුත් ඇත්තටම වැඩ කරන අයට පඩිය වැඩිකර ලබා දෙන්න කියා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාව සත්‍ය බවට මා යෝජනා කර සිටිමි.

**<u>ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
එම යෝජනාව මම ස්ථිර කර සිටිනවා.

## <u>2022.05.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සදහා ඉදිරිපත් කරන ලදී.</u>

**කාරණා අංක 01**
සභාව විසින් සවි කරන ලද වීථි ලාම්පු සම්බන්ධයෙන් මුදල් කමිටුවේ සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 03**
මින් ඉදිරියට වීථි ලාම්පු සවි කිරීම හෝ අළුත්වැඩියා කටයුතු සදහා යන සේවකයින් සදහා ගමන් වියදම් ගෙවීමේදී අදාළ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමාගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසුව ගෙවීම් කිරීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 02**
මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කංකානම් එස්.ආනන්දන් මහතා සම්බන්ධයෙන් මහජනතාව විසින් ගරු මන්ත්‍රීවරුන් හරහා ඉදිරිපත් කල පැමිණිලි කිහිපයක් සම්බන්ධයෙන් කමිටුවට කරුණු ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 04**
මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ විමර්ෂණ නිලධාරිතුමා මගින් පරික්ෂණයක් පැවැත්වීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 03**
කොමිස් පදනම මත ලබා දී ඇති නල්ලතන්නිය නගරයේ පොදු වැසිකිළිය හා රථ ගාල සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 05**
මේ සදහා හදිසි ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
තාවකාලික කඩ කාමරයක් ලබා දෙන ලෙස ඉල්ලා රත්නම් මහතා ඉදිරිපත් කල ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 06**
මේ සදහා වාරික 02න් මුදල් ගෙවා ඔහුට අවශ්‍ය තාවකාලික කඩ කාමරය ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**
ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 - රාජ්‍ය වියදම් පාලනය කිරීම අදාළ චක්‍රලේඛය ලේකම් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

> **තීරණ අංක 07**
> අදාළ චක්‍රලේඛය මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් පවසා තිබූ නමුත් 2022 සභා අයවැය මගින් මුදල් වෙන් කරන ලද මන්ත්‍රී ආධාර ව්‍යාපෘති සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 06**
මස්කෙළිය මහජන පුස්තකාලය සහ අප්කට් කියවීම් ශාලාව සදහා මිලදී ගන්නා පුවත්පත් සම්බන්ධයෙන් පුස්කාල භාරකරු විසින් ඉදිරිපත් කල ලිපිය.

> **තීරණ අංක 08**
> රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 03/2022 අයවැය චක්‍රලේඛයට අනුව මස්කෙළිය මහජන පුස්තකාලයට සහ අප්කට් කියවීම් ශාලාවට මිලදී ගන්නා පුවත්පත් වලින් අත්‍යාවශ්‍ය පුවත්පත් හැර අනෙකුත් පුවත්පත් මින් ඉදිරියට මිලදී නොගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 07**
කළමනාකරණ සේවා නිලධාරී ආර්.සුදාෂිනි මිය විසින් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ නිල නිවාසය ඉල්ලා ඉදිරිපත් කල ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී.

> **තීරණ අංක 09**
> අදාළ නිල නිවාසය අළුත්වැඩියා කිරීම සදහා සභා අරමුදලින් කොටසක් ගෙවීමට හා අනෙක් කොටස අදාළ නිලධාරිනිය විසින් දැරීමටත් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 08**
ආයුර්වේද මධ්‍යස්ථානය සදහා අවශ්‍ය ඖෂධ වර්ග සම්බන්ධයෙන් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

> **තීරණ අංක 10**
> සභා අරමුදලින් මෙම ඖෂධ මිලදී ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සමඟ අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කර සිටිමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.